# ශ්‍රී ලංකා පොලිසියේ ස්ථාන මාරු ප්‍රතිපත්තිය

## 01. හැඳින්වීම

යම් සේවා ස්ථානයක සේවය කරනු ලබන නිලධරයන්ට සාධාරණ කාලයක් තුළ ස්ථාන මාරු ලබාදීම සඳහාත් එකම ස්ථානයක දීර්ඝ කාලයක් සේවය කිරීම තුලින් ඇතිවිය හැකි අහිතකර තත්ත්වයන් පාලනය කිරීම සඳහාත්, විනිවිදභාවයකින් යුක්තව ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සඳහාත්, ශ්‍රී ලංකා පොලිසියට අනුයුක්ත නිලධරයන් සම්බන්ධයෙන් පහත සඳහන් ස්ථාන මාරුවීම් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පාටිපාටි රීති (2009.02.20 හා 1589/30 අති විශේෂ ගැසට් පත්‍රය) අනුව සිදු කිරීමට තීරණය කර ඇත.

## 02. ස්ථාන මාරු වර්ග

ස්ථාන මාරු වර්ග පහත පරිදි වේ.

i. වාර්ෂික ස්ථාන මාරු
ii. සේවා අවශ්‍යතාවය මත සිදු කෙරෙන ස්ථාන මාරු
iii. විනය හේතූන් මත සිදු කෙරෙන ස්ථාන මාරු
iv. නිලධරයන්ගේ ඉල්ලීම මත සිදු කෙරෙන ස්ථාන මාරු

## 03. වාර්ෂික ස්ථාන මාරු

### 3.1 හැඳින්වීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009.02.20 දිනැති අංක 1589/30 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 202 රීතියේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා පොලිසිය සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය.

**වාර්ෂික ස්ථාන මාරු කමිටුව මගින්;**

ස්ථාන මාරුවීම් අපේක්ෂා කරන නිලධරයන්ගේ ඉල්ලීම් ඉටු කිරීම සඳහා වාර්ෂික ස්ථාන මාරු කමිටුව ක්‍රියාත්මක කෙරේ. ඒ හැරුණු විට කිසියම් නිලධරයකුගේ සාධාරණ ඉල්ලීමක් ඉටු කිරීමට ඉඩ ලබා ගැනීම සඳහා හෝ යම් සේවා ස්ථානයක/කොට්ඨාසයක නියමිත සේවා කාලය සම්පූර්ණ කල නිලධරයකු වෙනත් සේවා ස්ථානයකට මාරු කිරීමට ද මාරු මණ්ඩල තීරණ ගත හැක.

## 3.2 වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වන නිලධරයන්

### 3.2.1 අදාළ නිලධරයන්

i. ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිවේදිත නිලධරයන්
ii. පොලිස් ස්ථානාධිපතිවරුන්
iii. සේවයේ යෙදී සිටින පොලිස් කොස්තාපල් රියදුරු තනතුරේ සිට ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුර දක්වා නිලධරයන්
iv. පොලිස් ආරක්ෂක සහායක නිලධරයන්
v. ඒකාබද්ධ සේවාවන්ට අයත් නොවන අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (උපලේඛන III) හි අර්ථ නිරූපනය කර ඇති ප්‍රාථමික මට්ටමේ හා ද්විතීයික මට්ටමේ නිලධරයන්

### 3.2.2 අයදුම්පත්‍ර කැඳවීම

**i.** ඉහත 3.2.1 (i) හි සඳහන් නිලධරයන්ගේ අයදුම්පත් කැඳවනු ලබන්නේ අමාත්‍යාංශ ලේකම් වරයා විසිනි.
**ii.** ඉහත 3.2.1 (ii සිට v) දක්වා නිලධරයන්ගේ අයදුම්පත් කැඳවනු ලබන්නේ පොලිස්පති විසිනි.
iii. අදාළ වන පරිදි පොලිස් 51 "අ" හෝ ඇමුණුම - 07 හි සඳහන් පෝරමය මගින් අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය.
iv. සේවා ස්ථානයක උපරිම සේවා කාලය සම්පූර්ණ කර ඇති නිලධරයකු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමේ දී පොලිස් 51 "ආ" මගින් ඉදිරිපත් කල යුතුය.
**v.** වාර්ෂික ස්ථානමාරු සඳහා ලැබෙන සියලු ම අයදුම්පත් අදාළ ස්ථානමාරු කමිටු වෙත යොමු කරනු ලැබේ.

### 3.2.3 සේවා ස්ථානයක සම්පූර්ණ කල යුතු සේවා කාලය

<table>
<tr><th>(i)</th><th>(ii)</th><th>(iii)<br>ස්ථානයක</th><th>(iv)<br>කොට්ඨාසයක</th><th>(v)<br>දිසාවක</th></tr>
<tr><td rowspan="2">ප්‍රාදේශීය</td><td>අවම</td><td colspan="3">03</td></tr>
<tr><td>උපරිම</td><td>05</td><td>08</td><td>12</td></tr>
<tr><td rowspan="2">ප්‍රියමනාප</td><td>අවම</td><td>02</td><td rowspan="2" colspan="2">-</td></tr>
<tr><td>උපරිම</td><td>05</td></tr>
<tr><td rowspan="2">ක්‍රියාකාරි කොට්ඨාසයක</td><td>අවම</td><td colspan="3">03</td></tr>
<tr><td>උපරිම</td><td colspan="3">12</td></tr>
</table>

සටහන:

ඉහත වගුවෙහි iii, iv හා v තීරුවල අවම සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධරයකු උපරිම සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති වුවද අදාල ස්ථානභාර නිලධාරියා විසින් වාර්ෂික ස්ථාන මාරු ලබා දීම සඳහා නිර්දේශ ඉදිරිපත් කල හැකිය